fairfirst INSURANCE
A FAIRFAX Company

# රෝහල්ගත කිරීම් සම්බන්ධ රක්‍ෂණ ආවරණය

රක්‍ෂණ හිමියෙකුට හදිසි අනතුරක් නිසා සිදුවන ශාරීරික හානියක්, රක්‍ෂණය ලබාගත් පසුව හදිසියේ ඇතිවන රෝග තත්ත්වයක් නිසා හෝ ආවරණය නොවන බවට විශේෂයෙන් දක්වා නොමැති සැත්කමක් සිදුකිරීම සඳහා රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික ලියාපදිංචිය සහිත සාත්තු නිවාසයක නේවාසික රෝගියෙකු ලෙස ඇතුළු වීමට හා ප්‍රතිකාර ගැනීමට සිදුවූ විට, අදාළ වෛද්‍ය හෝ ශල්‍යකර්ම ගාස්තු පියවීම සඳහා පහත දක්වා ඇති සීමාවන්ට යටත්ව ස්ථාවර මුදල් ප්‍රතිලාභයක් ලබාදීමට ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් කටයුතු කරයි.

## ආවරණයේ විස්තර

*රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක රෝහල්ගත වී ප්‍රතිකාර ලැබීමේදී, රෝහල්ගත වූ ප්‍රථම රාත්‍රිය හැර වසරකට රාත්‍රී 30 ක උපරිමයක් දක්වා ආවරණය හිමි වේ.

## 1. පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන් සඳහා ප්‍රතිලාභ සීමාවන්

### 1.1 සීමාවන්

| |
|---|
| වාර්ෂික සීමාව - උපරිම රාත්‍රී 30 ක් |

### 1.2 දෛනික දීමනා සහ වාරික සීමාවන්

ප්‍රතිලාභ සහ දෛනික වාරික සම්බන්ධ තොරතුරු සඳහා අංක 01 දරන උප කොටස බලන්න.

### 1.3 අගය එකතු කළ ප්‍රතිලාභය - පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන් සඳහා වන ඩෙංගු රෝග ආවරණය

ඩෙංගු රෝගය වැළඳී ඇති බවට තහවුරු වූ පසුව, අදාළ කොන්දේසි සපුරා ඇත්නම්, පහත සඳහන් සීමාවන් දෙකෙන් ඉහළ සීමාව ගෙවනු ලබනු ඇත.

1. පහත සඳහන් ඩෙංගු රෝග මුදල් දීමනාව හෝ
2. රෝහල්ගත වීමේ කාලසීමාව අනුව පහත සඳහන් ආකාරයට (උප කොටස 01), ප්‍රතිලාභ සම්බන්ධ සීමාවන්ට යටත්ව, රෝහල්ගත වීම් සඳහා වන සම්මත මුදල් දීමනාව තීරණය වේ.

| මාසික වාරිකය | ආවරණය වන දින ගණන | ඩෙංගු රෝග මුදල් දීමනාව |
|---|---|---|
| රු.78.60 සිට රු.157.20 | දින 16 සිට 30 හෝ 31 දක්වා | රු.12,500.00 |
| රු.01.00 සිට රු.78.60 | දින 01 සිට 15 දක්වා | රු.6,250.00 |

#### 1.3.1 ඩෙංගු රෝග මුදල් දීමනාව සඳහා:

- ඉහත සඳහන් ලිපිලේඛන සමග, පෞද්ගලික රෝහලකින් ලබාදුන්, ඩෙංගු ප්‍රතිදේහජනක පිළිබඳ NS1 වාර්තාවේ මුල් පිටපත හෝ රජයේ රෝහලකින් ලබාදුන්, ඩෙංගු ප්‍රතිදේහජනක තහවුරු කිරීම සහිත රෝග විනිශ්චය වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ.
- ලියාපදිංචි පෞද්ගලික රෝහලකදී සිදුකරන ලද NS1 ප්‍රතිදේහ ජනක පරීක්‍ෂණ වාර්තාවේ ප්‍රතිඵලය 'Positive' විය යුතුය (NS1 වාර්තාවේ රෝගියාගේ නම සහ වයස සඳහන් විය යුතුය).
- NS1 පරීක්‍ෂණ වාර්තාවේ 'Positive' ලෙස සඳහන් විය යුතු අතර මෙම ප්‍රතිඵලය රෝහල් ගත වී සිටින අතරතුර හෝ රෝහල් ගතවීමට පැය 72 කට නොවැඩි කාලසීමාවක් තුළ වාර්තා වී තිබිය යුතුය.
- රජයේ රෝහල් ගතවීමකදී NS1 වාර්තාව අනිවාර්ය නොවේ.
- ඉහත ලිපිලේඛනවලට අමතරව ඩෙංගු ඇන්ටිජන් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

### 1.3.2 වසංගත රෝග ආශ්‍රිත හිමිකම් සීමාවන්

- කෝවිඩ්-19 වසංගතයට අදාළ රක්ෂණ හිමිකම් 2021 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට සීමා කර ඇත.

| ප්‍රතිලාභ ස්ථරයන් | දෛනික දීමනාව එක් සම්පූර්ණ දිනක් සඳහා | හිමිකම් සීමාව එක් වසරක් සඳහා |
|---|---|---|
| පළමු ස්ථරය | රු.1,200.00 | රු.10,000.00 |
| දෙවන ස්ථරය | රු.4,000.00 | රු.12,000.00 |
| තුන්වන ස්ථරය | රු.6,500.00 | රු.14,000.00 |

### 1.4 පසුගෙවුම් පාරිභෝගිකයන් සඳහා වන ප්‍රතිලාභ දීර්ඝ කිරීම්

***2023 ජනවාරි මස 01 දින සිට පහත සඳහන් වාරික අදාළ වේ.**

| මාසික වාරිකය (බදු හැර) | | | | | |
|---|---|---|---|---|---|
| **මට්ටම** | **ප්‍රධාන සැලසුම අනුව** | **එක් කලත්‍රයෙකු සඳහා** | **එක් දරුවෙකු සඳහා** | **දෛනික දීමනා එක් රාත්‍රියක් සඳහා** | **වාර්ෂික සීමාව** |
| මූලික | රු.157.20 | රු.103.22 | රු.79.40 | රු.1,200.00 | රු.36,000.00 |
| සිල්වර් | රු.438.70 | රු.291.38 | රු.230.54 | රු.4,000.00 | රු.120,000.00 |
| ගෝල්ඩ් | රු.682.42 | රු.456.54 | රු.365.85 | රු.6,500.00 | රු.195,000.00 |

## 2. ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය

1. ලියාපදිංචි වීම සඳහා #107*1# ඩයල් කරන්න නැතිනම් 1343 ක්ෂණික ඇමතුම් අංකයෙන් BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගමේ පාරිභෝගික සේවාව අමතන්න.
2. #107* ඩයල් කර ලියාපදිංචි වූ පසු ඒ බව තහවුරු කරමින් පාරිභෝගිකයා වෙත SMS පණිවිඩයක් ලැබේ.
3. අදාළ ගාස්තුව පෙරගෙවුම් සම්බන්ධතාවක් නම් ජංගම දුරකථන ගිණුමෙන් දිනපතා අඩුවීමක් ලෙසින්ද, පසුගෙවුම් සම්බන්ධතාවක් නම් මාසික ගෙවීමක් ලෙසින්ද අයකරනු ලැබේ.
4. රෝහලෙන් පිටවීමේදී 1343 පාරිභෝගික සහය අංකය ඇමතිය යුතුය. එවිට නියෝජිතයෙකු ඔබට සහය වනු ඇත.
5. පාරිභෝගිකයාට හිමි වන්දි මුදල ඔහුගේ/ඇයගේ බැංකු ගිණුමට බැරකෙරෙනු ඇත. ගිණුම් අංකයක් ලබාදී නොමැති අවස්ථාවකදී, අවශ්‍ය සියලු ලිපිලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂණ හිමියා නමට චෙක්පතක් නිකුත් කෙරේ.

## 3. රක්ෂණ ඔප්පුව සඳහා වූ පොදු කොන්දේසි හා වරප්‍රසාද

### 3.1 භූගෝලීය කලාපය

මෙම රක්ෂණ ඔප්පුවෙහි සඳහන් සියළු ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට අයත් භූගෝලීය කලාපය තුල වැය කෙරෙන වියදම් සඳහා පමණක් අදාල වේ.

### 3.2 රක්ෂණාවරණය ආරම්භය හා අලුත් කිරීම

මෙම ඔප්පුව සඳහා මුදල් කපා හැරීම වහාම ආරම්භ වන අතර මෙය ආවරණය ලබන මාසයේ පළමු දින සිට ක්‍රියාත්මක වන අතර මාස තුනක (3) පොරොත්තු කාලය ආරම්භක දිනයේ සිට (2023 මාර්තු 20 සිට බලපැවැත්වේ) අදාළ වේ. ඔබගේ ආවරණ මුදල, වාරිකය මත පදනම් වනු ඇත: ඒ සඳහා අදාල විස්තරයන් ඇමුණුම 01 හි සොයාගත හැකි වේ. ඉන් අනතුරුව, මෙම ප්‍රතිපත්තිය එකල බලපැවැත්වෙන වාරික ගාස්තුව යටතේ මාසිකව අලුත් කළ හැකිය.

**3.3 වයස් සීමාව**

2023 මාර්තු 31 දින හෝ ඊට පෙර ලියාපදිංචි වූ සාමාජිකයින් සඳහා අදාළ වේ.

- ඇතුළත් වීමේ අවම වයස - අවුරුදු 18
- ඇතුළත් වීමේ උපරිම වයස - අවුරුදු 65
- ආවරණය නතර කරන වයස - අවුරුදු 65

2023 අප්‍රේල් 1 වැනි දින හෝ ඊට පසුව ලියාපදිංචි වූ සාමාජිකයන් සඳහා අදාළ වේ.

- ඇතුළත් වීමේ අවම වයස - අවුරුදු 18
- ඇතුළත් වීමේ උපරිම වයස - අවුරුදු 60
- ආවරණය නතර කරන වයස - අවුරුදු 65

**3.4 සුදුසුකම් සහ ලියාපදිංචිය**

මෙම ප්‍රතිපත්තිය යටතේ ආවරණය වන ග්‍රාහක අංකය හරහා ලියාපදිංචි වන අවස්ථාවේදී, සමාගම විසින් පිළිගනු ලැබුවහොත් රක්ෂණ ඔප්පුහිමියා වයස අවුරුදු දහඅට (18) සිට වයස අවුරුදු හැට පහ දක්වා 65 (2023 මාර්තු 31 හෝ ඊට පෙර) හෝ වයස අවුරුදු දහඅට (18) සිට වයස අවුරුදු හැට දක්වා 60 (2023 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක පරිදි) විය යුතුය.

**3.5 වාරික ගෙවීම්**

රක්ෂණ ඔප්පුහිමියා ඇණවුම 1.3 සහ 1.4 වගන්තිවලට අනුව බදු මුදලද ඇතුලත්ව තම වාරික මුදල් පියවිය යුතුය. රක්ෂණ ඔප්පුහිමියා මාසයක් සඳහා නොගෙවන්නේ නම්, සමාගමට ගෙවීම ලැබුණු පසු මාස තුනක (3) පොරොත්තු කාල සීමාවක් අදාළ වේ - 2023 මාර්තු 20 සිට මෙය බලපැවැත්වේ.

**3.6 රක්‍ෂණය අවලංගු වීම**

පහත සඳහන් අවස්ථාවන් මුලින් එළඹෙන අවස්ථාවකදී;

3.6.1 රක්ෂිතයාගේ වයස අවුරුදු 65 ඉක්මවීම, හෝ

3.6.2 රක්ෂිතයාගේ මරණය සිදුවීම, හෝ

3.6.3 ඩයලොග් සමාගම විසින් ඕනෑම හේතුවක් මත රක්ෂිතයා සමග ඇති ගිවිසුමෙන්/සම්බන්ධතාවෙන් ඉවත් වන හෝ එය අවලංගු කරන අවස්ථාවකදී, හෝ

3.6.4 රක්ෂණ හිමියා විසින් වාරික නොගෙවන ලද අවස්ථාවකදී.

**3.7 දැනුම් දීම්**

සමාගම වෙත යොමුකරනු ලබන සියලුම දැනුම් දීම් හා සන්නිවේදනයන් ලිඛිතව, සමාගමේ ලිපිනය වෙත යොමුකළ යුතු වේ. BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම රක්ෂිතයාගේ දායකත්ව අංකය ඔස්සේ ඔහු/ඇය සමග සම්බන්ධ වනු ඇත.

**3.8 සංශෝධනය කිරීම්**

රක්ෂණ හිමියා විසින් සමාගම වෙත අවසන් වරට ලබාදී ඇති ලිපිනයට සාමාන්‍ය තැපෑල මගින් දින 30 කට පෙර දැනුම් දීමක් සිදුකිරීමෙන් හෝ රක්ෂණ හිමියාගේ දුරකථන අංකයට SMS පණිවිඩයක් යොමුකිරීමෙන් අනතුරුව මෙම රක්ෂණ සැලසුමෙහි නියමයන් හා විධිවිධාන සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතුය.

**3.9 හිමිකම් ඉදිරිපත් කිරීම**

රෝහල්ගත කිරීමට අදාළ සියලු ලිපිලේඛන, රෝහලෙන් පිටවී ගොස් දින 90 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

**3.10 හිමිකම් පියවීම**

රක්ෂිතයා රෝහල්ගත වූ අවස්ථාවකදී, රක්ෂිතයා විසින් ඊට අදාළ හේතුව සහ සාක්ෂි සමග BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම හරහා ලිඛිතව ඒ බව ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් වෙත දැනුම්දිය යුතුය. මෙම දැනුම්දීම සමග, ප්‍රතිකාර කරන වෛද්‍යවරයාගේ ලියාපදිංචි අංකය සහිත සහතිකය සහ රෝහල්ගත කිරීමට හේතු වූ සත්‍ය හේතුව ඉදිරිපත් කළ යුතු වේ. රෝහල්ගත වූ පසු දින 90 ක් ඇතුලත BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම හරහා ලිඛිතව ඒ බව ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් වෙත දැනුම්දිය යුතු අතර, අදාළ දින ගණන ඉකුත්වී ඇති අවස්ථාවකදී ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් විසින් ඒ සම්බන්ධ වගකීම් දරනු නොලැබේ.

සෑම හිමිකම් මුදල් ඉල්ලීමක් සඳහාම 'අංක 3.14 දරන හිමිකම් මුදල් ලිපිලේඛන' ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් වෙත ඉදිරිපත් කළ යුතුය.

සත්‍ය සහ අනුමත හිමිකම් මුදල් ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය ලිපිලේඛන BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම වෙතින් ලැබුණු පසු, වැඩකරන දින 3ක් ඇතුළත ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම විසින් අදාළ හිමිකම් මුදල් ගෙවනු ලබනු ඇත.

කිසියම් මතභේදයක්, වංචාසහගත ක්‍රියාවක් පිළිබඳ සැකයක් හෝ වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වන කිසියම් තත්ත්වයක් මතුවී ඇත්නම්, ගෙවීම් කාලය දින 15ක් දක්වා හෝ, නීතිමය ක්‍රමවේදය හරහා මතභේදය විසඳාගැනීමට ගතවන කාලය දක්වා ප්‍රමාද විය හැක.

## 3.11 හිමිකම් සීමාව

ඉහත සඳහන් ආකාරයට, ගෙවන ලද වාරික අනුව, රෝහල්ගත වී සිටින කාලය සඳහා දෛනික දීමනාවක් ගෙවනු ඇත. ලිත් මාස 12 ක් සඳහා වන උපරිම හිමිකම් මුදල් ප්‍රමාණය, මෙහි අංක 1.1 හෝ 1.4 කොටස් වල සඳහා සීමාවන් ඉක්මවා නොයා යුතුය. එක් අවුරුද්දක් තුළ එක් රක්ෂණ හිමියෙකුට ඩෙංගු මුදල් දීමනාව ගෙවිය හැක්කේ එක වරක් පමණි.

## 3.12 සහතික, තොරතුරු හා සාක්ෂි

සියළු සහතික, තොරතුරු හෝ සාක්ෂි සමාගම විසින් ඉල්ලා සිටින පරිදි රක්ෂිතයා ස්වකීය වියදමින් සැපයිය යුතු වේ.

## 3.13 හිමිකම් මුදල් ඉල්ලීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන

3.13.1 රක්ෂණ හිමිකම් ඉල්ලීමේදී පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

- හිමිකම් මුදල් ඉල්ලීමේ පෝරමය
- සම්පූර්ණ කරන ලද රෝග විනිශ්චය කාඩ්පතේ පිටපතක්
- අනන්‍යතා ලේඛනයේ පිටපතක් (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය)
- රක්ෂණ ඔප්පුවට ඇතුළත් බවට සහතිකය (BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම මඟින් ලබා ගත යුතුය)

3.13.2 ඉහත ලිපිලේඛන වලට අමතරව NS1 වාර්තාව හෝ ඩෙංගු ඇන්ටිජන් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

3.13.3 කෝවිඩ්-19 ව්‍යාප්ත වසංගතය:

- රෝග විනිශ්චය කාඩ්පත
- පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (පී.සී.ආර්) පරීක්ෂණ වාර්තාව/ප්‍රතිදේහජනක වාර්තාව
- ජාතික හැඳුනුම්පත්/රියදුරු බලපත්‍රයේ පිටපතක්

3.13.4 හිමිකම් මුදල් ගෙවීම සලකා බලනු ලබන්නේ ඉහත සඳහා අවශ්‍යතා සියල්ල සපුරාලනු ලැබූ පසුව පමණි.

3.13.5 රෝග විනිශ්චය කාඩ්පත, පහත සඳහන් අංග ඇතුළත්ව නිසිපරිදි සම්පූර්ණ වී තිබිය යුතුය.

- රෝහලට ඇතුළත් වූ සහ පිටව ගිය දිනයන්
- රෝගියාගේ නම, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය
- රෝහලට ඇතුළු වීමට හේතු
- කරන ලද පරීක්ෂාවන්
- ලබාදුන් ප්‍රතිකාර සහ රෝහලෙන් පිටව යාමේදී ලබාදුන් ප්‍රතිකාර සැලසුම්
- වෛද්‍යවරයාගේ රබර් මුද්‍රාව සහ අත්සන

## 3.14 තොරතුරු සැපයීම හෝ වංචා සහගත ක්‍රියා

යම් හිමිකම් ඉල්ලීමක් සාවද්‍ය බවට හෝ අධිරෝපණයක් හෝ ව්‍යාජ තොරතුරක් හෝ ප්‍රකාශනයක් බවට හෝ එසේ හිමිකම් ඉල්ලීමට උදව් කිරීමක් ලෙස හෝ ඉහත සඳහන් ඕනෑම තත්වයක දී එබඳු රක්ෂිතයකු සඳහා රක්ෂණාවරණය අත්හිටුවීමේ සියලු බලතල රක්ෂණ සමාගම සතු වේ.

## 3.15 බලපවත්නා නීතිය

මෙම ඔප්පුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ නීතියට අනුව නිකුත් කර ඇති අතර එයට අනුකූලව කටයුතු කරයි.

**3.16 මුදල් ඒකකය හා ගෙවීම්**

රක්ෂිතයාට සහ සමාගමට සිදුකරන සියලු ගෙවීම් ශ්‍රී ලංකා රුපියල් වලින් සිදු කරනු ලැබේ.

**3.17 රක්ෂිතයෙකු විසින් සිතාමතා අසත්‍ය තොරතුරු ලබාදීම**

කිසියම් රක්ෂිතයෙකු විසින් තොරතුරු සැඟවීම හෝ අසත්‍ය තොරතුරු ලබාදීම සිදුකර ඇති අවස්ථාවකදී අදාළ රක්ෂිතයා සතු රෝහල් රක්ෂණාවරණ සැලසුම අවලංගු වේ.

**3.18 පැවරීමට නොහැක**

මෙම රක්ෂණ සැලසුම යටතේ ඇති රෝහල් රක්ෂණ ආවරණය වෙනත් කෙනෙකුට පැවරිය නොහැක.

ඩෙංගු රෝග මුදල් දීමනාව රක්ෂණ සැලසුම් හිමියාට පමණක් හිමිවන අතර එය වෙනත් කෙනෙකුට පැවරිය නොහැක.

**3.19 බැහැර කිරීම්**

පහත තත්වයන්ට අදාලව සිදුවන රෝහල් ගතවීම් මෙම ඔප්පුව යටතේ බැහැර කෙරෙන අතර එබඳු තත්වයන් සමාගම මගින් හිමිකම් ගෙවීමකට යටත් නොකෙරේ.

3.19.1 ගර්භණීභාවය, දරු උපත් සහ උපත් පාලනය සම්බන්ධ සංකූලතා ආවරණය වනුයේ, රක්ෂණ සැලසුම සඳහා ලියාපදිංචි වී මාස 9 ක් ගතවූ පසු සහ අඛණ්ඩව එම මාස 9 සඳහා වාරික ගෙවීම් කර ඇත්නම් පමණි.

3.19.2 රූපලාවණ්‍ය සැත්කම් සහ ප්‍රතිකාර.

3.19.3 සියලුම ග්‍රාහකයන් සඳහා 2023 මාර්තු 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙර සිට පැවති රෝග තත්ත්වයන්.

3.19.4 සියලුම ග්‍රාහකයන් සඳහා 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයුර්වේද ප්‍රතිකාර.

3.19.5 සියලුම ග්‍රාහකයන් සඳහා 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රෝහලගත වීමෙන් අනතුරුව ප්‍රථම රාත්‍රිය.

**3.20 අවලංගු කිරීම**

ඕනෑම අවස්ථාවක, රක්ෂණ හිමියා වෙත දැනුම්දීමක් සිදුකිරීමෙන් සහ, අවසන් වරට ගෙවන ලද වාරිකය BIMA Lanka Insurance Brokers (පුද්.) සමාගම හරහා රක්ෂිතයා වෙත ආපසු ලබාදීමෙන් අනතුරුව, රක්ෂණය මුළුමනින්ම අවලංගු කිරීමට හෝ කිසියම් රක්ෂිතයෙකු සම්බන්ධ ආවරණය අවලංගු කිරීමට සමාගමට බලය ඇත. රක්ෂිතයා දින 90 කට වැඩි කාලයක් වාරිකය ගෙවීමට අපොහොසත් වුවහොත්, ඔහු/ඇය ස්වයංක්‍රීයව රක්ෂණයෙන් ඉවත් කෙරේ. එමෙන්ම රක්ෂණ හිමියාට අවශ්‍ය නම්, සමාගම වෙත දැනුම් දීමෙන් අනතුරුව රක්ෂණය අවලංගු කළ හැකි අතර, රක්ෂණය වලංගුව පැවති කාලයට අදාළව සමාගම විසින් වාරික මුදලෙන් කොටසක් රඳවාගනු ලබනු ඇත. අදාළ කාලසීමාව තුළ සමාගම විසින් කිසියම් හිමිකම් මුදල් ඉල්ලීමක් ඉටුකර ඇත්නම්, රක්ෂණ හිමියා/රක්ෂිතයා වෙත වාරිකය ආපසු ගෙවීමක් සිදු නොකෙරේ.

**3.21 නීතිය සහ ආරවුල් විසඳීම**

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව සහ යටත්ව බලාත්මක වේ. කිසියම් හිමිකම් පෑමක්, ප්‍රශ්නයක් හෝ මෙම ගිවිසුමෙන් හෝ ඊට අදාළව එකඟ නොවීම් හෝ එය උල්ලංඝනය කිරීමකදී, පාර්ශවයන් ඒ සඳහා බලාත්මක හේතු විසඳීමට ඔවුන්ගේ හොඳම උත්සාහයන් භාවිත කරනු ඇත. මෙම බලපෑම සඳහා, ඔවුන් එකිනෙකා සමග හොඳ විශ්වාසයකින් උපදෙස් ලබාගෙන සාකච්ඡා කර ඔවුන්ගේ අන්‍යෝන්‍ය අවශ්‍යතා හඳුනාගෙන, සාධාරණ විසඳුමක් ලබාගැනීමට උත්සාහ කරනු ඇත. එවැනි තත්වයක් දින තිහක් (30) ඇතුළත පාර්ශවයන් එවැනි විසඳුමකට නොපැමිණියේ නම්, ඉන්ෂුවරන්ස් ඕම්බුඩ්ස්මන්වරයා හමුවේ පැමිණිලි කළ හැක. එහිදීත් එකඟතාවකට පැමිණීමට නොහැකි නම් කොළඹ පිහිටි ඕනෑම නිසි අධිකරණයක් හරහා විසඳාගැනීමට අවකාශය ඇත.

**4. අර්ථ නිර්වචනය**

**4.1** **හදිසි අනතුර හෝ හදිසි අනතුරක් නිසා ඇතිවන සිදුවීම්** යනු ක්ෂණිකව ඇතිවන, හිතාමතා නොවන, අනපේක්ෂිත, අසාමාන්‍ය සහ වෙනත් ඕනෑම හේතුවකින් තොරව, හඳුනාගත හැකි වේලාවක හා ස්ථානයක සිදුවිය හැකි ශාරීරික තුවාල ඇති කිරීමට හේතුවන ස්වාධීන සිදුවීමකි.

**4.2** **වාර්ෂික සීමාව** යනු රක්ෂණාවරණය ආරම්භ වූ දිනයේ පටන් වසරක කාලයක් තුල රෝහල්ගත වීමකදී එක් රක්ෂිතයෙකු සඳහා ලබාදිය හැකි උපරිම මුදල වේ.

**4.3** **දන්ත වෛද්‍ය ප්‍රතිකාර** යනු මූලිකව බී.ඩී.එස් (දන්ත ශල්‍ය උපාධිය) සුදුසුකම් ඇති ඉහල සුදුසුකම් සහිත හෝ රහිත වෛද්‍යවරුන්ගෙන් ලබාගන්නා ප්‍රතිකාරයන් වේ.

**4.4 රෝගයක්** යනු සාමාන්‍ය, නිරෝගී සෞඛ්‍ය තත්ත්වයෙන් ව්‍යාධිවේදීමය වශයෙන් වෙනස් වන කායික තත්ත්වයකි.

**4.5 රෝගී බව** යනු හදිසි අනතුරක් නිසා ඇති නොවූ, රක්ෂිතයාගේ කායික ඉන්ද්‍රියන්ට අදාළ ඕනෑම ව්‍යාධිවේදීමය තත්ත්වයක් හෝ අසාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් වන, වාස්තවික වශයෙන් රෝග විනිශ්චය කළ හැකි තත්ත්වයකි.

**4.6 තුවාල සිදුවීමක්** යන්නෙන් හදිසි අනතුරක් නිසා පමණක් සිදුවූ ශාරීරික හානි අදහස් වේ.

**4.7 සැත්කම** යනු පහත සඳහන් ප්‍රතිකාර ක්‍රමවේදයන් අදහස් වේ: දන්ත වෛද්‍ය සේවාවන් හැර, ශරීරයේ ඕනෑම ඉන්ද්‍රියක් හෝ වෙනත් කොටසක් යථා තත්ත්වයට පත්කිරීම, වෙනස් කිරීම හෝ නැවත සැකසීම සඳහා අදාළ ශරීර අංග කැපීම, ඉවත් කිරීම හෝ විද්‍යුත් ක්‍රමයට පිලිස්සීම.

**4.8 රෝහලක්** යනු රෝගී හා තුවාල සිදුවූ පුද්ගලයින්ට ප්‍රතිකාර ලබාදෙන රෝහලක් ලෙස සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ ලියාපදිංචි වූ, රෝග විනිශ්චය සහ ප්‍රධාන පෙළේ සැත්කම් සඳහා පහසුකම් සහිත, ලියාපදිංචි හා උපාධිධාරී හෙද හෙදියන් විසින් දවසේ පැය 24 පුරා හෙද සේවා ලබාදෙන ස්ථානයකි.

**4.9 රෝහල්ගතවීම් සහය සැලසුම් රක්ෂණය** යනු මෙම ගිවිසුමේ සඳහන් වගන්ති, නියමයන් හා කොන්දේසි අනුව ආවරණය ලබාදෙන රක්ෂණ සැලසුමයි. රෝහල්ගතවීම් සහය සැලසුම් රක්ෂණයේදී මාසිකව ගාස්තු අයකෙරෙන අතර එමගින් ඊළඟ මාසය සඳහා ආවරණය ලබා දේ.

**4.10 රෝහල්ගත වීම** යනු මූලික වශයෙන් බාහිර රෝගියෙකු වශයෙන්, එක්දින සැත්කමකට භාජනය වූවෙකු හෝ හදිසි ප්‍රතිකාර ඒකකයේ රෝගියෙකු ලෙස ප්‍රතිකාර ලබා ඉන්පසු වෛද්‍ය විශේෂඥයෙකු යටතේ ප්‍රතිකාර ලබාදීම සඳහා, ලියාපදිංචි අභ්‍යන්තර රෝගියෙකු ලෙස රෝහලකට ඇතුළත් කර, එහි රඳවාගනු ලැබීමය.

**4.11 නේවාසික රෝගියෙකු** යනු රෝගයක් හෝ අසනීපයක් හේතුවෙන් ප්‍රතිකාර අත්‍යවශ්‍ය වන විටදී හා පූර්ණකාලීන වෛද්‍ය අධීක්ෂණය යටතේ රෝහලක රැය පුරා රෝහල් ගත වී සිටීමට අවශ්‍ය වන අයෙකු වේ.

**4.12 රක්ෂිතයා** යනු ඩයලොග් සම්බන්ධතාවක් හිමි, මෙම ගිවිසුමේ සඳහන් විධිවිධාන අනුව රක්ෂණ සැලසුමකට (රෝහල්ගත වීම් සහය සැලසුම් රක්ෂණය) ඇතුළත් වී සිටින, ඉලෙක්ට්‍රොනික ලියාපදිංචිය සම්පූර්ණ කළ සහ ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් විසින් පිළිගන්නා ලද, මෙම රක්ෂණයට අදාළ සුදුසුකම් සපිරූ පුද්ගලයෙකි.

**4.13 සැලසුම් වර්ෂය** යනු සැලසුමේ ආරම්භක දිනයේ සිට එහි වර්ෂ පූර්ණයෙන් අවසන් වන මාස 12 ක කාලයක් වේ.

**4.14 වාරිකය** යනු රෝහල් රක්ෂණ සැලසුම සඳහා රක්ෂිතයා විසින් රක්ෂණ සමාගම වෙත ගෙවනු ලබන ගාස්තුවය.

**4.15 ආවරණයේ සාරාංශය** යනු BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම විසින් සෑම රක්ෂිතයෙකුම වෙත ලබා දිය යුතු, රෝහල් රක්ෂණ සැලසුම සම්බන්ධි නිවැරදි තොරතුරු වේ. ඔප්පුවේ ඇතුළත් නියෝග, අදාළ වගන්ති හා කොන්දේසි ආදිය රක්ෂිතයාට පැහැදිලි ලෙස අවබෝධ කරගත හැකිවන පරිදි සංක්ෂිප්තව විස්තර කර තිබිය යුතුය. ආවරණයේ සාරාංශය ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමාගම මගින් පිළියෙල කරනු ලබනු ඇත.

**4.16 ඇතුළත් වීමේ දිනයෙන්** අදහස් වන්නේ රක්ෂිතයාගේ සැලසුම බලාත්මක වන දිනය වේ.

**4.17 ආවරණ මට්ටම** යනු 1.2 සහ 1.4 වගන්ති වල සඳහන් වන වාරික මට්ටම් අනුව ගෙවනු ලබන දෛනික දීමනාව අදහස් වේ.

**4.18 රක්ෂකයා හෝ සමාගම** යනු ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අදහස් වේ.

**4.19 BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම** යනු, ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම හා ඔප්පු හිමියා අතර තාක්ෂණිකමය ඒකාග්‍රතාවය ඇතිකරමින් පහසුකම් සපයන ආයතනය වේ.

**4.20 පූර්ව රෝගී තත්ත්වයන්** යනු, හෘදයාබාධ, පිළිකා, වකුගඩු රෝග සහ ආඝාතය යනාදියෙන් හටගන්නා වූ තුවාල, අසනීප රෝග තත්ත්වයක් හෝ රෝග ලක්ෂණ වේ.

(අ) ඔප්පුව ආරම්භ වීමට පෙර ප්‍රතිකාර, ඖෂධ හෝ වෛද්‍ය උපදෙස් ලබා ඇති හෝ ලබා ගනිමින් සිටින, හෝ අනාගතයේදී ලබාදීමට බලාපොරොත්තුවෙන් සිටින අවස්ථාවන්.

(ආ) ඔබ හෝ රක්ෂිත පුද්ගලයා ඔප්පුව ආරම්භ කිරීමට පෙර ප්‍රතිකාර හෝ ඖෂධ හෝ රෝග විනිශ්චය සෙවූ හෝ ලැබුණු බව දැනසිටි අවස්ථාවකදී.

***යම් අවස්ථාවකදී ඉංග්‍රීසි සහ සිංහල ඔප්පු අනුවාදයන් අතර යම් අසංතුලිතතාවයක් ඇති වුවහොත්, ඉංග්‍රීසි ඔප්පුවේ වචන බලපැවැත්වේ.***

| ජනවාරි | | පෙබරවාරි | | *පෙබරවාරි- අධික අවුරුද්ද | | මාර්තු | | අප්‍රේල් | | මැයි | | ජූනි | | ජූලි | | අගෝස්තු | | සැප්තැම්බර් | | ඔක්තෝබර් | | නොවැම්බර් | | දෙසැම්බර් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය | සාර්ථක ලෙස අඩුකරන ලද දින ගණන | ඊළඟ මාසයේ ආවරණය |
| 31 | 1,200 | 28 | 1,200 | 29 | 1,200 | 31 | 1,200 | 30 | 1,200 | 31 | 1,200 | 30 | 1,200 | 31 | 1,200 | 31 | 1,200 | 30 | 1,200 | 31 | 1,200 | 30 | 1,200 | 31 | 1,200 |
| 30 | 1,161 | 27 | 1,157 | 28 | 1,159 | 30 | 1,161 | 29 | 1,160 | 30 | 1,161 | 29 | 1,160 | 30 | 1,161 | 30 | 1,161 | 29 | 1,160 | 30 | 1,161 | 29 | 1,160 | 30 | 1,161 |
| 29 | 1,123 | 26 | 1,114 | 27 | 1,117 | 29 | 1,123 | 28 | 1,120 | 29 | 1,123 | 28 | 1,120 | 29 | 1,123 | 29 | 1,123 | 28 | 1,120 | 29 | 1,123 | 28 | 1,120 | 29 | 1,123 |
| 28 | 1,084 | 25 | 1,071 | 26 | 1,076 | 28 | 1,084 | 27 | 1,080 | 28 | 1,084 | 27 | 1,080 | 28 | 1,084 | 28 | 1,084 | 27 | 1,080 | 28 | 1,084 | 27 | 1,080 | 28 | 1,084 |
| 27 | 1,045 | 24 | 1,029 | 25 | 1,034 | 27 | 1,045 | 26 | 1,040 | 27 | 1,045 | 26 | 1,040 | 27 | 1,045 | 27 | 1,045 | 26 | 1,040 | 27 | 1,045 | 26 | 1,040 | 27 | 1,045 |
| 26 | 1,006 | 23 | 986 | 24 | 993 | 26 | 1,006 | 25 | 1,000 | 26 | 1,006 | 25 | 1,000 | 26 | 1,006 | 26 | 1,006 | 25 | 1,000 | 26 | 1,006 | 25 | 1,000 | 26 | 1,006 |
| 25 | 968 | 22 | 943 | 23 | 952 | 25 | 968 | 24 | 960 | 25 | 968 | 24 | 960 | 25 | 968 | 25 | 968 | 24 | 960 | 25 | 968 | 24 | 960 | 25 | 968 |
| 24 | 929 | 21 | 900 | 22 | 910 | 24 | 929 | 23 | 920 | 24 | 929 | 23 | 920 | 24 | 929 | 24 | 929 | 23 | 920 | 24 | 929 | 23 | 920 | 24 | 929 |
| 23 | 890 | 20 | 857 | 21 | 869 | 23 | 890 | 22 | 880 | 23 | 890 | 22 | 880 | 23 | 890 | 23 | 890 | 22 | 880 | 23 | 890 | 22 | 880 | 23 | 890 |
| 22 | 852 | 19 | 814 | 20 | 828 | 22 | 852 | 21 | 840 | 22 | 852 | 21 | 840 | 22 | 852 | 22 | 852 | 21 | 840 | 22 | 852 | 21 | 840 | 22 | 852 |
| 21 | 813 | 18 | 771 | 19 | 786 | 21 | 813 | 20 | 800 | 21 | 813 | 20 | 800 | 21 | 813 | 21 | 813 | 20 | 800 | 21 | 813 | 20 | 800 | 21 | 813 |
| 20 | 774 | 17 | 729 | 18 | 745 | 20 | 774 | 19 | 760 | 20 | 774 | 19 | 760 | 20 | 774 | 20 | 774 | 19 | 760 | 20 | 774 | 19 | 760 | 20 | 774 |
| 19 | 735 | 16 | 686 | 17 | 703 | 19 | 735 | 18 | 720 | 19 | 735 | 18 | 720 | 19 | 735 | 19 | 735 | 18 | 720 | 19 | 735 | 18 | 720 | 19 | 735 |
| 18 | 697 | 15 | 643 | 16 | 662 | 18 | 697 | 17 | 680 | 18 | 697 | 17 | 680 | 18 | 697 | 18 | 697 | 17 | 680 | 18 | 697 | 17 | 680 | 18 | 697 |
| 17 | 658 | 14 | 600 | 15 | 621 | 17 | 658 | 16 | 640 | 17 | 658 | 16 | 640 | 17 | 658 | 17 | 658 | 16 | 640 | 17 | 658 | 16 | 640 | 17 | 658 |
| 16 | 619 | 13 | 557 | 14 | 579 | 16 | 619 | 15 | 600 | 16 | 619 | 15 | 600 | 16 | 619 | 16 | 619 | 15 | 600 | 16 | 619 | 15 | 600 | 16 | 619 |
| 15 | 581 | 12 | 514 | 13 | 538 | 15 | 581 | 14 | 560 | 15 | 581 | 14 | 560 | 15 | 581 | 15 | 581 | 14 | 560 | 15 | 581 | 14 | 560 | 15 | 581 |
| 14 | 542 | 11 | 471 | 12 | 497 | 14 | 542 | 13 | 520 | 14 | 542 | 13 | 520 | 14 | 542 | 14 | 542 | 13 | 520 | 14 | 542 | 13 | 520 | 14 | 542 |
| 13 | 503 | 10 | 429 | 11 | 455 | 13 | 503 | 12 | 480 | 13 | 503 | 12 | 480 | 13 | 503 | 13 | 503 | 12 | 480 | 13 | 503 | 12 | 480 | 13 | 503 |
| 12 | 465 | 9 | 386 | 10 | 414 | 12 | 465 | 11 | 440 | 12 | 465 | 11 | 440 | 12 | 465 | 12 | 465 | 11 | 440 | 12 | 465 | 11 | 440 | 12 | 465 |
| 11 | 426 | 8 | 343 | 9 | 372 | 11 | 426 | 10 | 400 | 11 | 426 | 10 | 400 | 11 | 426 | 11 | 426 | 10 | 400 | 11 | 426 | 10 | 400 | 11 | 426 |
| 10 | 387 | 7 | 300 | 8 | 331 | 10 | 387 | 9 | 360 | 10 | 387 | 9 | 360 | 10 | 387 | 10 | 387 | 9 | 360 | 10 | 387 | 9 | 360 | 10 | 387 |
| 9 | 348 | 6 | 257 | 7 | 290 | 9 | 348 | 8 | 320 | 9 | 348 | 8 | 320 | 9 | 348 | 9 | 348 | 8 | 320 | 9 | 348 | 8 | 320 | 9 | 348 |
| 8 | 310 | 5 | 214 | 6 | 248 | 8 | 310 | 7 | 280 | 8 | 310 | 7 | 280 | 8 | 310 | 8 | 310 | 7 | 280 | 8 | 310 | 7 | 280 | 8 | 310 |
| 7 | 271 | 4 | 180 | 5 | 207 | 7 | 271 | 6 | 240 | 7 | 271 | 6 | 240 | 7 | 271 | 7 | 271 | 6 | 240 | 7 | 271 | 6 | 240 | 7 | 271 |
| 6 | 232 | 3 | 180 | 4 | 180 | 6 | 232 | 5 | 200 | 6 | 232 | 5 | 200 | 6 | 232 | 6 | 232 | 5 | 200 | 6 | 232 | 5 | 200 | 6 | 232 |
| 5 | 194 | 2 | 180 | 3 | 180 | 5 | 194 | 4 | 180 | 5 | 194 | 4 | 180 | 5 | 194 | 5 | 194 | 4 | 180 | 5 | 194 | 4 | 180 | 5 | 194 |
| 4 | 180 | 1 | 180 | 2 | 180 | 4 | 180 | 3 | 180 | 4 | 180 | 3 | 180 | 4 | 180 | 4 | 180 | 3 | 180 | 4 | 180 | 3 | 180 | 4 | 180 |
| 3 | 180 | 0 | - | 1 | 180 | 3 | 180 | 2 | 180 | 3 | 180 | 2 | 180 | 3 | 180 | 3 | 180 | 2 | 180 | 3 | 180 | 2 | 180 | 3 | 180 |
| 2 | 180 | 0 | - | 0 | - | 2 | 180 | 1 | 180 | 2 | 180 | 1 | 180 | 2 | 180 | 2 | 180 | 1 | 180 | 2 | 180 | 1 | 180 | 2 | 180 |
| 1 | 180 | 0 | - | 0 | - | 1 | 180 | 0 | - | 1 | 180 | 0 | - | 1 | 180 | 1 | 180 | 0 | - | 1 | 180 | 0 | - | 1 | 180 |